සීතාවක ප්‍රාදේශීය සභාව
කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
------------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභාව විසින් ඉදිකරනු ලැබූ වටිනාකම රු.78,835,788 ක් වූ ගොඩනැගිලි ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ වෙන්දේසියෙන් අලෙවි කර ඉවත් කරන ලද භාණ්ඩවල පිරිවැය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ දානපතියකුගෙන් ලද ඉඩමක ඉදිකල "දඹෝර" තුරුණු ඉගෙනුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පිරිවැය හා ඉඩමේ අගය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්
----------------------

සභා බලප්‍රදේශයේ කළුඅග්ගල ග්‍රාමයේ ස්ථාපිත විනෝද උයනක අයිතිකරු විසින් සභාවට විනෝද බදු නොගෙවීම මත ඊට එරෙහිව සභාව විසින් අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩු පවරා තිබූ අතර එම විනෝද උයන අයිතිකරු විසින් ද සභාවට එරෙහිව වෙනත් නඩුවක් ගොනුකර තිබුණි. 2018 අප්‍රේල් 12 දක්වාම එම නඩු සමථයකට පත්වී නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි සටහනක් ලෙස හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 නොසැසඳුනු ගිණුම්
----------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03කට අදාල ශේෂයන් හා උපයෝගි පොත්/උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 1,419,072 ක වෙනසක් පැවතුනි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

ගෙවිය යුතු ගිණුම්
----------------------

ගෙවල් කුලී තැන්පතු
-------------------------

වර්ෂ 1989 සිට 2015 දක්වා කාලයට අදාලව ගෙවල් කුලී හිමියන් වෙත ගෙවිය යුතු එකතු වටිනාකම රු.157,261 ක ගෙවල් කුලී තැන්පතු නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

සීතාවක ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට රු.27,165 ක පාවහන් කට්ටල 30 ක් ලබා දීම වෙනුවෙන් පාවහන් ලබාගත් බවට අත්සන් තබන ලද නාම ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණතීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ජේදය | - | සභා වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) පළාත් පාලන චක්‍රලේඛ | | |
| (i) 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | - | කඩකුලී තක්සේරුව වසර 3කට වරක්වත් සිදුකල යුතු වුවද අවසන් වරට කඩකුලී තක්සේරු කර තිබුනේ 2012 වර්ෂයේදීය. |
| (ii) 2016 ජුලි 11 දිනැති අංක LGD/08/2016 දරන බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | - | සභාවට අයිති ඉඩම් හා දේපල භෞතිකව හඳුනාගැනීමට සහ මිනින්දෝරුවකු මගින් මිනුම් කිරීමට කමිටුවක් පත්කර නොතිබුණි. |
| (ඇ) වෙනත් චක්‍රලේඛ | | |
| 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛය | 3,236,906 | නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ පවතින ශේෂය හඳුනාගත් ව්‍යාපෘතීන් සඳහා යොදා ගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.45,556,388 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,247,988 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 24,252,000 | 25,781,592 | 26,989,385 | 6,227,647 | 20,328,000 | 19,130,653 | 17,099,198 | 7,923,257 |
| (ii) කුලී | 19,289,000 | 19,298,329 | 19,909,434 | 196,929 | 24,030,300 | 4,135,012 | 4,649,656 | 440,820 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,00,2,000 | 2,148,631 | 1,700,450 | - | 2,026,800 | 1,663,045 | 1,663,045 | - |

2.2.2 වරිපනම් හා බදු

(අ) වරිපනම්

සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.4,696,105 ක් වු අතර ඉන් රු.958,842 ක් පෙර වර්ෂවලට අදාල හිඟ වරිපනම් විය.

(ආ) අක්කර බදු

පාදුක්ක උපකාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු වටිනාකම රු.178,980 ක් වූ අතර ඉන් රු.127,250ක් අවුරුදු 05 කට වඩා වැඩි කාලයකට අදාල විය.

2.2.3 උසාවි දඩ

2014 ජුලි සිට 2017 දෙසැම්බර් දක්වා කාලයට අදාලව අයවිය යුතු උසාවි දඩ වටිනාකම රු.43,000,000 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කලයුතුව තිබුණු කර්තවයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය විය.

3.2 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්යය මණ්ඩලය 222 ක් වූ අතර ප්‍රාථමික හා ද්විතීක ශ්‍රේණිවල පුරප්පාඩු 21 ක් පැවතුනි. තථ්‍ය කාර්ය මණ්ඩලය 265 ක් වූ අතර ඉන් 64 ක් ආදේශක සේවකයින් විය.

(ආ) සේවක ණය

---------------

2017 දෙසැම්බර් 31 දින වනවිට විශ්‍රාම ලබා ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු.500,910 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

-------------------------------

නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

2007 ජුලි 25 දින රු.850,000 කට මිලදී ගත් ට්‍රැක්ටරයක් හා 2007 ඔක්තෝබර් 17 දින මිලට ගත් වටිනාකමක් හඳුනාගත නොහැකි ටේලර් 2ක් ඌන උපයෝජිතව හංවැල්ල වැඩබිමේ ගාල්කර තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ඇස්තමේන්තු කරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම්/වියදම්, සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 50 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) වැය විෂයයන් 34 ක් සඳහා සලසා තිබූ එකතුව රු.3,940,000 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 23 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබූ රු.101,059,000 කින් සියයට 50කට වඩා අඩුවෙන් වැය කර තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

--------------------------

සභාවේ අභ්‍යන්තර විගණනය සඳහා 2017 වර්ෂයේදී කළමනාකරණ සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරිනියක පත්කර රාජකාරී පවරා දී තිබුණද එම රාජකාරී කටයුතු ඉටුකර නොතිබූ අතර අභ්‍යන්තර විගණන සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) වත්කම් හා දේපළ | පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| (ආ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම |
| (ඇ) තොග | ලේඛනගත නොකිරීම හා අවිධිමත් තොග පාලනය |
| (ඈ) මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |